අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය
நீதிச்சேவை ஆணைக்குழுச் செயலகம்
Judicial Service Commission Secretariat

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT

මගේ අංකය / எனது இலக்கம் / My No. JSC/SEC/CIR - L/2022 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2022.06.16

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 01/2022**

සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සියළුම අධිකරණ නිලධාරීන්,
සියළුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් සහ
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත,

**<u>අධිකරණ කටයුතු පැවැත්වීම සම්බන්ධවයි</u>**

01. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 15/2022 හා 2022.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක් වන ලදී.

02. 2020 මාර්තු මස සිට 2022 වර්ෂය ආරම්භය දක්වාම රට තුළ පැවැති කෝවිඩ් වසංගත තත්ත්වය මත සාමාන්‍ය පරිදි අධිකරණ කටයුතු පැවැත්වීමට ඇති වූ බාධා හේතුවෙන් කල් තබන ලද නඩු විශාල සංඛ්‍යාවක් ද, එසේම එදිනෙදා නියමිත නඩු ද වශයෙන් දෛනිකව සැලකිය යුතු නඩු සංඛ්‍යාවක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේ දී දිවයින පුරා පිහිටි අධිකරණ අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පැවතීමත්, මීට අමතරව ඉදිරි මාස කිහිපය තුළ සියලු රජයේ වැඩ කරන දින සඳහාම මේ වන විටත් අධිකරණ මගින් විභාග නඩු හා කැඳවීම් නඩු සඳහා දින නියම කර තිබීමත්, (fixed) සැලකීමට ගත් අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ වල සේවා අවශ්‍යතාවය සැලකීමට ගෙන දෛනික කටයුතු වලට බාධාවක් ඇති නොවන පරිදි, අත්‍යාවශ්‍ය අවම නිලධරයන් / සේවකයන් පමණක් සේවයට කැඳවීමට හැකිවන පරිදි නිශ්චිත වැඩපිළිවෙලක් (චක්‍රීය පදනම මත/Rotational Basis) සකස් කර, ඒ අනුව සතියේ දින 05 ම (සඳුදා සිට සිකුරාදා දක්වා) අධිකරණ කටයුතු පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව ඔබට දැන්වීමට මට නියම කර ඇත.

03. ඉහත පරිදි අධිකරණ කටයුතු පවත්වන යම් දිනයක දී අධිකරණයේ සේවයට කැඳවනු ලබන්නේ අත්‍යාවශ්‍ය අවම නිලධරයන් / සේවකයන් සංඛ්‍යාවක් පමණක් වන බවට සහතික වනු පිණිස, ඔබ විසින් එකී කාරණය පුද්ගලිකවම සොයා බලා කටයුතු කල යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

පිටපත: **01.** නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ **12.**

**02.** ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, කොළඹ **10.**

**03.** පොලිස්පති, පොලිස් දෙපාර්තමේන්තුව, කොළඹ **01.**

**04.** බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ **09.**

**05.** ලේකම්, නීතිඥ සංගමය, කොළඹ **12.**

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT | JUDICIAL SERVICE COMMISSION SECRETARIAT
තැ.පෙ. 573, අළුත් කඩේ, කොළඹ 12. த.பெ.இல. 573, புதுக்கடை, கொழும்பு 12. P.O. Box 573, Hulftsdorp, Colombo 12.
ලේකම් / செயலாளர் / Secretary (+94) 11 2321104
කාර්යාලය / அலுவலகம் / Office (+94) 11 2433119 / 2451159
(+94) 11 2446111
jscinformaion@jsc.gov.lk
www.jsc.gov.lk